කෝරළෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
-------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 02 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015අගෝස්තු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කෝරළෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
---------------------------------------------------------------

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසිපරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරන අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 16,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.
(ආ) 1990 වර්ෂයේදී වූ යුදමය වාතාවරණ හේතුවෙන් රු. 681,000 වටිනා ට්‍රක්ටර් යන්ත්‍ර අස්ථාන ගතවී තිබුණද, එම වටිනාකම පොත්වලින් ද ලියාහැරීමට කටයුතු නොකිරීම නිසා වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගතවී තිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්
----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයිස් වාඩි හතරක අයිතිකරුවන්ගෙන් අයවියයුතු රු. 112,000 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු වර්ෂ හයකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුනද එය අයකර ගැනීම සඳහා කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල දිගටම පෙන්වා තිබුණි.
(ආ) වාලච්චේනයි කඩදාසි කම්හලෙන් අයවියයුතු වරිපනම් බදු රු. 11,290,841 ක මුදල වර්ෂ එකොලහකට වඩා වැඩි කාලයක සිට හිඟව තිබූ අතර එය අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවස හැරගිය සහ විශ්‍රාම ගිය සේවකයින් හතර දෙනෙකුට ලබාදෙන ලද ණය මුදලින් අයකර ගතයුතු රු. 96,026 ක් 2010 වර්ෂයේ සිට හිඟව පැවතියද ඒවා ඔවුන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා තිබූ සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ------- | ------------ | ------------------------ |
| | රු. | |
| ඉඩම් ගොඩනැගිලි | 35,936,292 | ඉඩම් ඔප්පු |
| යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ | 441,876 | ස්ථාවර වත්කම් ලේඛන |
| ලීබඩු සවිකිරීම | 1,151,262 | ස්ථාවර වත්කම් ලේඛන |
| පුස්තකාල පොත් | 1,552,655 | ස්ථාවර වත්කම් ලේඛන |

1.3.5 නීති, රීති හා කළමණාකරණ තීරණ සනාදියට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත සඳහන් නීති සහ රීති වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ----------------------------- | ------------------- |
| (අ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති<br>------------------------------------------ | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය යනාදී කටයුතු නිලධාරින් තුන් දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය X වගන්තිය 191 | සමාලෝචිත වර්ෂයේදී සභා රැස්වීම් දොලහක් පවත්වා තිබුණද, එම රැස්වීම් වල සහතික කළ රැස්වීම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | රු. 898,894 ක කල් ඉකුත්වූ තැන්පත් සම්බන්යෙන් මුදල් රෙගුලාසිවල විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | සභා තීරණ අංක 26 | ආදායම් අයකිරීම් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පහත් පිළියෙල කර ගැසැට්පත්‍රයේ පළකලයුතුවූවද අද දක්වා පළකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂයේ පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 2,327,190 ක් වූ අතර, එය සැසදීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,949,089 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,621,899 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය
---------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැලකියයුතු විචලනයක් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | අයකළ | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | % |
| වරිපනම් හා බදු | 3,750 | 1,966 | 1,784 | 47 |
| බදු | 3,300 | 2,190 | 1,110 | 33 |
| බලපත්‍ර ගාස්තු | 1,625 | 1,203 | 422 | 25 |
| සේවා ගාස්තු | 2,075 | 1,839 | 234 | 11 |
| වෙනත් ආදායම් | 2,725 | 2,254 | 471 | 17 |

2.2.2 වරිපනම් බදු සහ බදු
----------------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි යනාදිය සඳහා 1989 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු සඳහා තක්සේරුකර අයකර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම් අයවීම්

--------------------------

වර්ෂ 07 කට පමණ පෙර සහා බලප්‍රදේශයේ ස්ථාපිතකර තිබූ දුරකථන කුළුණු 05 ක් වෙනුවෙන් අයවියයුතු රු. 120,000 ක ගාස්තුව සභාව විසින් මෙතෙක් අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නෙල්සිප් ව්‍යාපෘත්තියෙන් ක්‍රියාත්මක වන කර්මාන්තයන් අධීක්ෂණ කිරීම සඳහා සභාව විසින් 2012 පෙබරවාරි 09 දින නිලධාරියෙකු පත්කර තිබුණද, ඔහු සෙවයට වාර්තා කර නොතිබූ බැවින් ඔහුට සභාවෙන් වැටුප් ගෙවා නොතිබුණි. එසේ වූවද වැටුප් නොගෙවීම් සම්බන්ධයෙන් සභාවට එරෙහි උසාවි පවරා තිබූ නඩුවෙන් හිඟ වැටුප් වශයෙන් රු. 194,163 ක් අදාල අයට ගෙවනලෙස නියෝගකර ඒ අනුව ගෙවීම් කර තිබුණි.

(ආ) සභාවේ සේවකයන් 15 දෙනෙකු වෙනුවෙන් සේවක භාරකාර අරමුදලට ගෙවියයුතු දායක මුදල නියමිත දිනවල ගෙවීම් නොකිරීම නිසා එම අරමුදලට රු. 67,004 ක අඩි ගාස්තුවක් සභාව ගෙවීමට සිදුවිය. තවද, මේ සම්බන්ධයෙන් අරමුදල විසින් පවරන ලද නඩුව සඳහා රු. 20,218 ක මුදලක් නඩු වියදම් වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) සභාව සතු වාහන 22 ක් සඳහා වසර 10 කට වඩා වැඩි කාලයක් සිට රක්ෂණ ආවරණ සභාව විසින් ලබාගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු රු. මිලියන් 20 ක් වටිනා ජල පිරිසිදුකිරීම් යන්ත්‍රය 2010 වර්ෂයේදී අස්ථාන ගතවී තිබුණද වගකියයුතු අය හදුනාගෙන ඔහුට විරුද්ධව නීතියානුකූලව කටයුතු කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 මැයි 27 වන දින රු. 42,000 ක් මුදලකට සභාව විසින් මිළදී ගෙන තිබූ වාහන සෝදන High presure වතුර මෝටරය ක්‍රියාකරන ආකාරය පිළිබඳ දැනීම නොවැති නිසා ප්‍රයෝජනට නොගෙන මේ දක්වා ගබඩාවේ තිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ප්‍රයොජනට ගන්නා ට්‍රක්ටර් රථ තුනක් අළුත්වැඩියා නොකර වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් ගාල්කර තිබූ බව නිරීක්ෂණ විය.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 47% සිට 86% දක්වා විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) අයවැය පාලනය